# පුරප්පාඩු

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

**(2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ව්‍යවස්ථාපිත)**

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත දක්වෙන තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. පර්යේෂණ නිලධාරී (තනතුරු 01)

**සුදුසුකම්** : බාහිර/ අභ්‍යන්තර අයදුම්කරුවන්

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජයීය විද්‍යාව, නීතිය පිළිබඳ විශේෂ වේදී උපාධියක් ලබා තිබීම.

**හෝ**

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජයීය විද්‍යාව, නීතිය පිළිබඳ සාමාන්‍ය උපාධියක් සමග පර්යේෂණාත්මක අධ්‍යනයයකින් යුතු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 22 නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු නැත.

**වැටුප් ක්‍රමය** : AR1 - 2016 රු. (53,150 – 10 X 1,375 – 15 × 1,910 – 95,550)

## 02. තොරතුරු තාක්ෂණ සහකාර (තනතුරු 01)

**සුදුසුකම්** : බාහිර / අභ්‍යන්තර අයදුම්කරුවන්

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 22 නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු නැත.

**වැටුප් ක්‍රමය** : MA 2-1 රු. (30,310–10 X 300–7 X 350–4X495–20X660–50,940)

**පොදු කොන්දේසි**

1. රාජ්‍ය හෝ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/කොමිෂන් සභාවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.
2. තෝරාගනු ලබන අය 1956 අංක 22 රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති යටතේ පනවා ඇති නීති රීති වලට යටත් වේ.
3. පත්කරනු ලබන දින සිට සේවක අර්ථසාධක අරමුදලට කොමිෂන් සභාව මගින් 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා 3% දායක මුදලක් ගෙවනු ලැබේ.
4. පත්වීම්ලාභීන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ වෛද්‍ය රක්ෂණ ආවරණය ලැබේ.
5. සියලු තනතුරු සඳහා රජය අනුමත දීමනා හිමි වේ.

අයදුම්කරුවන් සහතික වල ඡායා පිටපත් සමග තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් 2025.02.24 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,**
**කාමර අංක 203-204, ගොඩනැගිලි අංක 02,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.**

**තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.**